දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය පේරාදෙණිය විශ්වවිද්‍යාලය
தொடர் தொலைக் கல்விநிலையம் - பேராதனைப் பல்கலைக்கழகம்
CENTRE FOR DISTANCE & CONTINUING EDUCATION – UNIVERSITY OF PERADENIYA

## Bachelor of Arts (External-New Syllabus) Examination - 100 Levels - 2025

## ECNE 102: සංසන්දනාත්මක ආර්ථික සංවර්ධනය

**උපදෙස්:**
කාලය : පැය 03 යි
එක් කොටසකින් අඩුම තරමින් ප්‍රශ්න දෙකක් තෝරාගෙන ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ
මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 10ක් අඩංගු වේ.

---

### I කොටස

1. i. මහා බ්‍රිතාන්‍යය වැඩවසම් ක්‍රමයේ සමාජාර්ථික බලපෑම් දක්වා ඒවා අගයන්න. (ලකුණු 10)

   ii. බටහිර යුරෝපයේ වැඩවසම් ක්‍රමය බිදවැටීම කෙරෙහි දායක වූ ප්‍රධාන ආර්ථික, සමාජ, දේශපාලනික හා තාක්ෂණික බලවේග විවේචනාත්මකව විභාග කරන්න. (ලකුණු 10)

2. i. මහා බ්‍රිතාන්‍යයේ කොටුකිරීමේ ව්‍යාපාරය යන්නෙහි අදහස විස්තර කොට එහි මූලික අංගලක්ෂණ සාකච්ඡා කරන්න. (ලකුණු 08)

   ii. මහා බ්‍රිතානයේ පළමු හා දෙවන කොටුකිරීමේ ව්‍යාපාරවල සමාජ හා ආර්ථික බලපෑම් විවේචනාත්මකව අගයන්න. (ලකුණු 12)

3. දහ අටවන ශතවර්ෂයේ අගභාගයේ හා හා නවවන ශතවර්ෂයේ මුල් භාගයේ ආර්ථික සංවර්ධනයට බ්‍රිතාන්‍ය කපු පිළි කර්මාන්තයේ දායකත්වය විභාග කරන්න. (ලකුණු 20)

4. "දහ අටවන ශතවර්ෂයේ අගභාගයේ හා හා නවවන ශතවර්ෂයේ මුල් භාගයේ සිදුවූ බ්‍රිතාන්‍ය කාර්මීකරණය හදිසියේ සිදුවූ දෙයක් නොව ක්‍රමානුකූලව ඇතිවූ ක්‍රියාවලියකි." සාකච්ඡා කරන්න. (ලකුණු 20)

5. මහා බ්‍රිතාන්‍ය සැලකිල්ලට ගනිමින් පහත සඳහන් ඕනෑම හතරකට (04) කෙටි සටහන් ලියන්න;

   i. මහා බ්‍රිතාන්‍ය කපු පිළි කර්මාන්තයේ තාක්ෂණික සංවර්ධනය
   ii. ආර්ථික වර්ධනයට බ්‍රිතාන්‍ය දුම්රිය කර්මාන්තයේ දායකත්වය
   iii. නොර්ෆොක් ක්‍රමය
   iv. රාජ්‍ය නිර්බාධ ප්‍රතිපත්තිය
   v. අදෘශ්‍යමාන හස්තය

   (එක් කොටසකට ලකුණු 05)

## II කොටස

6. බ්‍රිතාන්‍ය පාලන සමයේ ශ්‍රී ලංකා ආර්ථිකයේ ස්වභාවය විස්තර කිරීමට "ද්විත්ව ආර්ථිකය" යන යෙදුමේ යෝග්‍යතාව අගයන්න.

(ලකුණු 20)

7. 19 වන ශතවර්ෂයේ වැවිලි ආර්ථිකය සඳහා දේශීය ශ්‍රම සැපයුම අඩුවීමට හේතු විවේචනාත්මකව විභාග කරන්න. (ලකුණු 20)

8. 19 වන ශතවර්ෂයේ ශ්‍රී ලංකාවේ කෝපි කර්මාන්තයේ ශීඝ්‍ර ව්‍යාප්තියට බලපෑ හේතු විශ්ලේෂණය කර එහි ප්‍රධාන ආර්ථික බලපෑම් තක්සේරු කරන්න.

(ලකුණු 20)

9. 19 වන ශතවර්ෂයේ හඳුන්වා දුන් කොල්බෲක් කොමිසම් ප්‍රතිසංස්කරණවල ආර්ථික හා පරිපාලනමය වෙනස්කම් සාකච්ඡා කරන්න. (ලකුණු 20)

10 ශ්‍රී ලංකාව සැලකිල්ලට ගනිමින් පහත සඳහන් ඕනෑම හතරකට **(04)** කෙටි සටහන් ලියන්න;

- i 19 වන ශතවර්ෂයේ ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික කෘෂිකර්මාන්තය
- ii මුදල් මණ්ඩල ක්‍රමය
- iii 1884-1906 කාලයේ තේ කර්මාන්තය
- iv කිරිට ඉඩම් පනත
- v බ්‍රිතාන්‍ය පාලන සමයේ වෘත්තිය සමිති කටයුතු (එක් කොටසකට ලකුණු 05)

************************